විද්‍යාලය :- තෙප්පනාව කුමාර මහා විද්‍යාලය

සිංහල භාෂාව හා සාහිත්‍යය :- 12 ශ්‍රේණිය පැවරුම්

පුරාතන ගද්‍ය සාහිත්‍යය :- අනුරුද්ධ කුමාර කතාව (පූජාවලිය )

විෂය භාර ගුරු :- ඕ.එම්.එන්.කරුණාරත්න

**01.පූජාවලී කතුවරයා කතා රසය මතු කිරීමට අත්භූත සිද්ධි ගෙනහැර පෑමට සමතෙකි .අනුරුද්ධ කුමාර කතාව ඇසුරෙන් පැහැදිලි කරන්න?**

☞පිළිතුර ලිවීමට අත්වැලක්

●කතාවේ මුඛ්‍ය රසය ඉස්මතු කිරීම සඳහා අවස්ථාවට හා සිද්ධියට ගැළපෙන  පරිදි අත්භූත ජනක අවස්ථා මතුකරන ස්ථාන නිදසුන් වශයෙන් ගත යුතුය .

1. නුවරට අරක්ගත් දේවතාව රන්තලියේ සුවඳ කැවුම් මැවීම.

**"ඒ ගෙන යන්නා වූ තලියෙහි දිව්‍ය වූ සුවඳ කැවුම් මවාලීය "**

2.අපාගත වූ පුද්ගලයන් නිරයේ දුක්විඳින අයුරු අත්භූත රසයෙන් යුතුව ඉදිරිපත් කිරීම .

**"දිව උයන්වල දිවකෙළි කෙල ඇවිද්දාහු කලෙක අසිපත් වෙනෙහි කැපි කැපී ඇවිදිනාහුමය"**

**"දිව්‍ය ප්‍රසාදවල සුවවිඳ ඇවිද්දාහු කලෙක  නරකවහ්නිජාලාභ්‍යන්තරයට පැමිණෙන්නාහුමය"**

**"දිව්‍යගංගාවල ස්නානය කොට ඇවිද්දාහු කලෙක වෛතරණී නම් ක්ෂාරෝදක ගංගාවලත් ඇවිදිනාහුමය"**

●ඒවා පාඨකයන්ට හා ශ්‍රාවකයන්ට රසවිඳීමට උපකාර වන අයුරු දැක්වීම.

●ඒවා අර්ථවත්ම හා උචිත පරිදි මනා ලෙස භාෂාවට සුසංයෝග කර තිබීම.

●කතු හිමියන්ගේ අරමුණ සමග ඒවායේ ඇති ගැළපීම .(බණ කීම පිණිස විසිතුරු කතා දැක්වීම ,ආත්මාර්ථ පරාර්ථ පිණිස පිනට යොමු කිරීම....ආදි අරමුණු )